www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩේවෝස් ලෝක ආර්ථික සංසදය හමුවේ බැංකුකරුවන්ගේ ප්‍රතිරෝධය

## Bankers defiant at Davos World Economic Forum

2010 පෙබරවාරි 4

1930 ගනන්වලින් මෙපිට ලෝක ධනවාදයට පහර දුන් විශාලතම මූල්‍ය අර්බුදයෙන් දෙවසරක් ගත වූ පසු ගිය සතියෙහි, ස්විට්සර්ලන්තයේ ඩේවෝස්හි පැවැත්වුනු ලෝක ආර්ථික සංසදයේ දී ප්‍රමුඛ පෙලේ ජාත්‍යන්තර බැංකුකරුවන් ප්‍රකට කලේ, සිය සමපේක්ෂනාත්මක භාවිතය පාලනය කිරීම සඳහා දැරෙන ඕනෑ ම ප්‍රයත්නයකට තමන් ප්‍රතිරෝධය පාන බව යි. ආන්ඩු වලට පෙර නොවූ විරූ මට්ටමක නය කන්දරාවකට කරගැසීමටත් කෝටි සංඛ්‍යාත රැකියා අහිමි වීමටත් තුඩු දුන්නේ බැංකුවල මෙම භාවිතයන්ය

පසු ගිය 40 වසර පුරා ඉහල පෙලේ දේශපාලනඥයන් ද ආර්ථශාස්ත්‍රඥයන් ද සමග ලෝකයේ ප්‍රමුඛ පෙලේ බැංකුකරුවන් සහ ප්‍රධාන විධායකයින් සිය ව්‍යාපාරික මූලෝපායන් සාකච්ඡා කර ඇති මෙම ආර්ථික සංසදයේ මෙවර වාර්ෂික ඩේවෝස් සභා වාරයේ වැඩ කටයුතුවල පසුබිම සකස් වී තිබුනේ

"දෙපැත්තකින් වන" පසුබැසීමක් ද වෙලඳ යුද්ධය ද රටවල් පිටින් බංකොලොත් වීම ද පිලිබඳ අනතුරු ඇඟවුම් වලිනි.

ජනාධිපති ඔබාමාගේ ප්‍රධාන ආර්ථික උපදේශක ලැරී සමර්ස් ඩේවොස්හි දී පල කල අදහස්වලින් නුදුරු අනාගතයේ දී එක්සත් ජනපදය සහ චීනය අතර වෙලඳ යුද්ධයක් ඇති වෙතැයි පවතින බිය වැඩි විය. චීන මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ෂූ මින් සමග පැවති මාන්ඩලික සාකච්ඡාවක දී චීනයේ වෙලඳ හා මූල්‍ය ප්‍රතිපත්තිවලට පහර දුන් සමර්ස්, සිය ආරක්ෂනවාදී පියවර දැඩි කිරීම මඟින් ඒවාට ප්‍රතිචාර දැක්වීමට එක්සත් ජනපදය සූදානම් වන බවට අනතුරු ඇඟවී ය.

ලෝකය වටා ආන්ඩු ආර්ථිකය තුලට පොම්ප කල දැවැන්ත මුදල් කන්දරාවෙන් හට ගන්නා ප්‍රතිවිපාක පෙන්වා දෙමින් හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා මහාචාර්ය කෙනත් රොගොෆ් සෘජුව ම පවසා සිටියේ, වසර 30 ගනන්වල පසු වන "අයට දරුනු ප්‍රතිවිපාක අත් වනු ඇති" බව යි. සංසදයේ දී ජර්මානු ආර්ථිකයේ නයගැති භාවය ගැන කතා කරමින් රොගොෆ් තරුන ජර්මානුවෙකුට පැවසුවේ, ජර්මනියේ ඉහවහා යන නය සම්බන්ධයෙන් ගත් කල, සීමා පැනවීමේ පියවර හා සැලකිය යුතු ලෙස බදු ඉහල දැමීම ද හැර වෙන විකල්පයක් නැති බවත් ය. "එය ඉතාම වේදනාකාරී වනු ඇත," රොගොෆ් තව දුරටත් කී ය.

තමන්ගේම ක්‍රියා පිලිවෙත්වල ව්‍යසනකාරී ප්‍රතිඵල කෙරෙහි සමුලුවේ දී බැංකුකරුවන් ප්‍රතිචාර දැක් වූයේ සිය ලාභ ද ඩොලර් මිලියන සංඛ්‍යාත ප්‍රසාද දීමනා ද ආරක්ෂා කර ගැනීම සඳහා ඒකරාශී වීම තුලිනි. පසු ගිය දෙවසරේ සිදුවීම්වලින් ජාත්‍යන්තර මූල්‍ය වංශාධිපතියන් උකහා ගෙන ඇති වැදගත් ම පාඩම නම්, තමන්ට ඇප දීම සඳහා තම තමන්ගේ ආන්ඩු මඟින් කොන්දේසි විරහිතව ලබා දෙන සහාය ගැන බලාපොරොත්තු තැබිය හැකි ය යන්න යි.

කාලයිල් ගෲප් එල්පී ආයතනයේ සමාරම්භකයෙකු වන ඩේවිඩ් රුබෙන්ස්ටයින් හා නිව් යෝක් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය නෝරියෙල් රූබිනි අතර ඇති වූ විවාදයක දී මෙය ප්‍රකාශයට පත් විය. "අපිට පුංචි පහේ හෘද අකරනයකට මූන පාන්න සිද්ධ වුනා තමයි, ඒත් ඉස්සරහට එන හෘද අකරන එහෙමට ම මාරක වෙන්නෙ නැහැ, ඒ කියන්නෙ අපි ගොඩක් දේවල් ඉගෙන ගෙන තියෙනවා," රුබෙන්ස්ටයින් කීවේ ය.

රුබෙන්ස්ටයින් ඉගෙන ගත් පාඩම නම්, ආන්ඩුව ලබා දෙන පිටුබලයේ ප්‍රතිඵලයක් ලෙස සමපේක්ෂන අවස්ථා කිසි විටෙකත් මෙතරම් ශුභදායී වී නැති බව යි. ආයෝජන කිරීම සඳහා මෙය "බෙහෙවින් ආකර්ෂනීය" කාලයක් යැයි පැවසූ ඔහු, 2009 දී තම ආයෝජන කන්ඩායම නිම කල ගනුදෙනු "මෙම

දශකයේ අප කර ඇති හොඳ ම ගනුදෙනු බව සනාථ කරනු ඇතැ"යි පුරසාරම් දෙඩී ය.

මෑතක දී ඔබාමා ඉදිරිපත් කලාක් වැනි, බැංකු අංශයේ සමහර කටයුතු නියාමනය කිරීමට කල යෝජනා ඩේවොස් රැස්වීමේ දී සාකච්ඡාවට ලක් කල ප්‍රධාන කරුනකි. එබඳු යෝජනාවලින් සමස්ත සමපේක්ෂන වානිජ්‍ය ක්ෂේත්‍රය ම සාකච්ඡාවට ගැනීමක් සිදු නොවන්නේ ය, ඒවා ප්‍රධාන වශයෙන් ම ඉදිරිපත් වන්නේ මහජන පරිභෝජනය සඳහා ය යන්න ගැන බැංකුකරුවන් හොඳින් දැනුවත් ය. එක්සත් ජනපද අටුවාකාරයෙකු සඳහන් කල පරිදි, "බැංකුවල කටයුතු හික්මවීම සඳහා ඉදිරිපත් වන ඕනෑ ම යෝජනාවක්, දේශපාලනඥයන්ට ස්වර්ගයට යන්නට අවස්ථාව ලැබෙන තරමටම කොන්ග්‍රසයෙන් ද අනුමත වන්නට ඉඩ තිබෙන්නේ ය. "

ඩේවොස් සමුලුව ඇරඹුනේ, ජාත්‍යන්තර වශයෙන් බැංකු නියාමනය කිරීම පිලිබඳ කාරනය මතු කරමින් ප්‍රන්ස ජනාධිපති නිකොලස් සර්කොසි කල කතාවකිනි. සර්කොසි බැංකුකරුවන්ගේ කෑදරකම විවේචනය කලේ ය. වානිජ බැංකු හිමිකම් වෙලඳාම් කිරීම තහනම් කිරීමට ඔබාමා පාලනාධිකාරය කල යෝජනාවට ඔහු එකඟතාව පල කලේ ය. දෙවන ලෝක යුද්ධය අවසානයේ දී එක්සත් ජනපදයේ ආර්ථික ආධිපත්‍යය සුරක්ෂිත කල ජාත්‍යන්තර ගිවිසුම් සිහිපත් කරමින් නව බ්‍රෙටන් වුඩ්ස් පද්ධතියක් ඇති කල යුතු යැයි කෑඳවුම් කලේ ය. තමන් ප්‍රමුඛතාව දෙන්නේ ධනවාදය බේරා ගැනීමට මිස එය වල දැමීමට නොවන බව අවධාරනය කිරීමට සර්කොසි මහත් වෙහෙසක් දැරුවේ ය.

එහෙත් මූල්‍ය වංශාධිපතියන් ප්‍රන්ස ජනාධිපතිගේ පුරාජේරුව සැලකිල්ලට ගත්තේ සැක මුසුව ය. සර්කොසිගේ සෑඳහුම්වලට ද ඔබාමාගේ යෝජනාවලට ද දක්වන ප්‍රතිචාරය කුමක් දැයි විමසූ අවස්ථාවේ එයට පිලිතුරු දුන් එක්සත් ජනපද ස්ටෑන්ඩර්ඩ් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි ජැකෝ මාරි කියා සිටියේ, " එම යෝජනාවලින් බොහොමයක් දේශපාලනික වශයෙන් සිත් ඇද ගන්නාසුලු වුනත් ප්‍රයෝගිකව ක්‍රියාවට නැඟිය නොහැකි" බව යි.

ඩේවොස්හි දී බැංකුකරුවන් පෑ විරෝධයට නායකත්වය දුන්නේ, ජර්මනියේ විශාලතම බැංකුව වන ඩොයිෂ් බෑන්ක්හි ප්‍රධාන විධායක ජෝසෆ් ඇකර්මාන් සහ බ්‍රිතාන්‍යයේ විශාලතම බැංකුවලින් එකක් වන ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි පීටර් සෑන්ඩ්ස් ය.

මාන්ඩලික සාකච්ඡාවක දී ඇකර්මාන් සිය ප්‍රේක්ෂකයන්ට කියා සිටියේ "දෝෂාරෝපනය කිරීමේ" සෙල්ලම නතර කිරීමට දැන් කාලය බව යි. ප්‍රධාන බැංකු සිය නය දීම් තව දුරටත් කපා හැරීමට ඉඩ තිබෙන බවට යන්තමින් සඟවා කල තර්ජනයක දී ඇකර්මාන් මෙසේ අනතුරු ඇඟවී ය ''(ආර්ථිකයේ) මෙම ප්‍රකෘතිමත් වීමට උපකාරවන තරම් ශක්තිමත් මූල්‍ය අංශයක් ඔබට නැත් නම් ... ඔබ කර ගන්නේ විශාල වැරැද්දක්, ඔබ පසුව ඒ ගැන කනගාටු වේවි."

සෑන්ඩ්ස් ද ඇකර්මාන්ගේ අදහස් ම ප්‍රතිරාව නැංවී ය. "කඩාවැටීමට ඉඩ හැරීමට තරම් විශාල වැඩි'' යයි වර්තමානයේ ආන්ඩුවල සැලකිල්ලට ලක් වන බැංකු විසුරුවා හරින පියවරයන්ට තමන් සහාය දෙන්නේ දැයි විමසූ විට සෑන්ඩ්ස් "නිසැක පිලිතුර වන්නේ නැත යන්න'' යයි පැවසීය.

තම කටයුතු සීමා කිරීමට ගන්නා ඕනෑ ම පියවරක් පසුබැස්විය හැකි පොදු මූලෝපායක් සාකච්ඡා කිරීම සඳහා පැවැත්වුනු බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමකට සමුලුව අතරතුර දී ඇකර්මාන් සහභාගි විය. ප්‍රන්සයේ සහ බ්‍රිතාන්‍යයේ මුදල් ඇමතිවරුන් ද යුරෝපා මහ බැංකුවේ සභාපති ජීන්-ක්ලෝඩ් ට්‍රිෂෙට් ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කලමනාකරන අධ්‍යක්ෂ ඩොමිනික් ස්ට්‍රාවුස්-කාන් ද සමග රහසිගත සාකච්ඡා පැවැත්වීමට ඔහු සහ අනෙකුත් ප්‍රමුඛ පෙලේ බැංකුකරුවෝ ජනවාරි 30දා රැස් වූහ. මන්ත්‍රී මන්ඩල මූල්‍ය සේවා කමිටුවේ ප්‍රධානී, එක්සත් ජනපද කොන්ග්‍රස් සභික බාර්නි ෆ්‍රෑන්ක් ද ඊට සහභාගි විය.

කතාබහ පිලිබඳව කිසිදු තොරතුරක් එලිදරව් කිරීම ප්‍රතික්ෂේප කරන අතරවාරයේ, "පෙර කිසි කලෙකටත් වඩා ව්‍යාපාරික නායකයන්, දේශපාලන සහ නියාමන නායකයන් අතර හොඳ සංවාදයක් පවතින්නේ යැ"යි ප්‍රකාශ කරමින් ඇකර්මාන් සහයෝගිතාවේ ජීව ගුනය වග වර්නනා කලේ ය.

ඩේවොස් සංසදයෙන් දෙදිනකට පසුව, ජර්මානු ෆෙඩරල් අධීක්ෂන අධිකාරිය ජර්මනිය තුල ඉදිරි විකුනුම්වලට පනවා තිබූ තහනම ඉවත් කලේ ය. ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය පුපුරා යාමත් සමග, 2008 සැප්තැම්බරයේ දී, ජර්මානු නියාමන අධිකාරිය එම සමපේක්ෂන විධිය තහනම් කර තිබින.

ඩේවොස්හි දී බැංකුකරුවන් විදහා පෑ උද්ධච්චකම තුලින් පෙන්නුම් කලේ, තමන්ගේ අවශ්‍යතාවලට

මුලුමනින් ම යටත්ව සිටින දේශපාලනික කුලයක් සම්බන්ධයෙන් ඔවුන් තුල පවතින අවඥා සහගත ආකල්පයයි. ඩේවොස්හි දී පැවැත්වුනු රහසිගත සාකච්ඡාවලින් පැහැදිලි වූයේ, බැංකුවල කටයුතු නියාමනය කිරීමට ධනවාදී ආන්ඩු සැලසුම් කරන ඕනෑ ම පියවරක් පුහු ආටෝපයකට වැඩි දෙයක් නොවන බව යි.

පසුගිය දෙවසරක කාලය, බැංකු හා ප්‍රමුඛ මූල්‍යායතන පතුරුවා ඇති දැවැන්ත දේශපාලන අනුහස හා සමාජීය වශයෙන් ඉටුකල විනාශකාරී භූමිකාවේ පරිමාව එලිමහනට ගෙනැවිත් තිබේ. ගැඹුරුවන සමාජ ව්‍යසනය නතර කල හැක්කේ, මූල්‍ය කතිපයාධිකාරයන් අත්පත් කරගෙන, සමාජවාදී මූලධර්ම මත ලෝක ආර්ථිකය පරිවර්තනය කිරීමේ කොටසක් ලෙස, කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ බැංකු, මහජන උපයෝගිතා ආයතන බවට හැරවීමෙන් පමනි.

**ස්ටීවන් ස්ටයින්බර්ග්**

© www.wsws.org